# ඔස්ට්‍රේලියාවේ එල්.ඩී.එස්. (ප.ද.ශු.) සභාව

මාරියෝ ප්‍රනාන්දු පුල්ලේ - එන්ඩෙවහිල්ස් - මෙල්බන්

ඔස්ට්‍රේලියාවේ ධර්මදූත මෙහෙවර හයක් යට 300 කට වැඩි වන්දනා සමූහවල 150,000 ටත් වැඩි සාමාජිකයින් හා දේවමාලිගාවල් පහක් සහිතව යේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ පසු දවස්වල ශුද්ධවන්තයින්ගෙන් යුත් සභාව මේ ප්‍රදේශයේ ප්‍රභාමත්ව සිටියි.

විලියම් ජේම්ස් බරත් එංගලන්තයේ සිට ඇඩිලේඩ්වලට 1840 නොවැම්බර් මස සංක්‍රමනය කළ විට ප.ද.ශු. සභාව ඔස්ට්‍රේලියාවට හඳුන්වා දෙනු ලැබුවා. ඔහු දොළොස් දෙනාගේ ගණ පූර්ණයේ සාමාජික ජෝර්ජ් ඒ. ස්මිත් විසින් වැඩිහිටියෙකු වශයෙන් පැවිදි කරනු ලදුව හැකි හැම අවස්ථාවේදීම ශුභාරංචිය බෙදා ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. ඔහු රොබට් බියුචැම්ප් ව බෞතීස්ම කළේය. අනුමාන කරනු ලබන පරිදි බියුකෑම්ප් ඔස්ට්‍රේලියාවේ ප.ද.ශු සභාව වැලඳගත් පලවෙනි පුද්ගලයා වූ අතර පසුව බියුකෑම්ප් ඔස්ට්‍රේලියා ධර්මදූත පළාතේ සභාපති විය.

බ්‍රිතාන්‍ය අලුතෙන් ආගම වැළඳගත් අය වන ඇන්ඩෘ සහ එලිසබෙත් ඇන්ඩර්සන් තමන්ගේ දරුවන් තුන්දෙනා සමග 1941 දී නිව් සවුත් වේල්ස් වල ඩුබ්බෝ අසල වෙලිංටන්වලට සංක්‍රමනය වූහ. ඇන්ඩර්සන් බොහෝ ආගමට එන්නන් බෞතීස්ම කළ අතර,1844 දී සභාවේ පළවෙනි ඔස්ට්‍රේලියානු ශාඛාව වෙලිංටන්වල සංවිධානය කළේය.

### වැඩියෙන්ම වේගයෙන් වැඩෙන කිතුනු සභාව

ඔස්ට්‍රේලියාවේ ප.ද.ශු. සභාවේ ධර්මදූත සේවය නිල වශයෙන් පටන් ගත්තේ ජෝන් මුර්ඩොක් සහ චාර්ලස් ඩබ්ලිව්. වැන්ඩෙල් යූටාවල සිට සිඩ්නිවලට 1851 දී ඔක්තෝම්බර් 30 වෙනිදා ආවිටය. පළවෙනි සභා ගොඩනැගිල්ල 1904 දී බ්‍රිස්බෙන්වල තනනු ලැබූ අතර රටේ පළවෙනි දේවමාළිගාව 1984 දී නිම කරන ලදී,

එක්දහස් නමසිය පනස්පහේ ඔස්ට්‍රේලියාවේ සාමාජිකයින් 3,000 සිටි අතර අවුරුදු පහකින් 10,000 කට ආසන්න සංඛ්‍යාවක් සිටියහ. එක්දහස් නමසිය හැත්තෑව වන විට සාමාජික සංඛ්‍යාව 32,000 දක්වා තෙගුණයකටත් වැඩි විය. වර්ෂ 1980 දී එය 50,000 දක්වා ඉහල නැග්ගේය. අද රටේ වැඩිම වේගයෙන් වැඩෙන ක්‍රිස්තියානි බවට පත්වෙමින් ඔස්ට්‍රේලියාවේ සංඛ්‍යාව 150,000 ඉක්මවා ඇත.

### දහම

සෑම ප.ද.ශු. සාමාජිකයෙකුගේම මෙලොව අවසාන ඉලක්කය පවුල් විලාශයෙන් මුද්‍රා වීම වන අතර, එය සිදුකරනු ලබන්නේ අඹු සැමි වශයෙන් හා දෙමව්පියන් හා දූ දරුවන් වශයෙන් දේව මාලිග (නි)වේදීය. මෙලොව මරණයෙන් පසු ඉහලම ඉලක්කය පවුල් වශයෙන් එකමුතුව දෙවි පියාණන් වහන්සේ, දේවපුත්‍රයාණන් වහන්සේ හා දේව ශුද්ධාත්මයාණන් වහන්සේ සමග සදහටම ජීවත් වීමයි.

1 කොරින්ති 15:29 හි සඳහන් පරිදි ආදී කිතුනුවන් තුල පැවති සිරිත අනුව මෙලොව සිටි කාලයේ නිසි බෞතීස්මය නොලබා මිය ගිය ඥාතීන් වෙනුවෙන් මළවුන්ගේ බෞතීස්මය සිදු කරනු ලැබේ.

මෙලොව සජීවී හා මළවුන් සඳහා වූ දේවාමලිගා වත් පිළිවෙත් ඔස්ට්‍රේලියාවේ පවුලු ඉතිහාස මධ්‍යස්ථාන 183 ක ප්‍රවර්ධනය කරනු ලැබේ. සාමාජිකයින් තමන්ගේ පරම්පරා හතරක්වත් වාර්තා සටහන් කර ගබාගන්නා ලෙස දිරිගන්වනු ලබති. පවුල් ඉතිහාස මධ්‍යස්ථානයෙහි පවුල් ඉතිහාස උපදේශකයෝ අවශ්‍ය උපදෙස් ලබා දීමට සැරසී සිටිති.

### දේවමාලිගා වත්පිළවෙත් සිදුකරගත හැකි ඔස්ට්‍රේලියාවේ පිහිටි දේව මාලිගා පහ මෙසේය

1. ඇඩිලේඩ් ඔස්ට්‍රේලියා දේව මාලිගාව
   (Adelaide Australia Temple) 53-59 Lower Portrush Road,
   Marden SA 5070 - TEL. 61 8363 8000

2. බ්‍රිස්බෙන් ඔස්ට්‍රේලියා දේව මාලිගාව
   Brisbane Australia Temple, 200 River Terrace, Kangaroo Point QLD

3. මෙල්බන් ඔස්ට්‍රේලියා දේව මාලිගාව
   Melbourne Australia Temple, 76 Cathies Lane, Wantirna South
   VIC 3152 - TEL 61 39881 9700

4. පර්ත් ඔස්ට්‍රේලියා දේව මාලිගාව
   Perth Australia Temple 163-173 Wordsworth Avenue,
   Yokine WA 6060, TEL 618-92-0000

5. සිඩ්නි ඔස්ට්‍රේලියා දේව මාලිගාව
   Sydney Australia Temple, 756 Pennant Hills Road,
   Corner Pennant Hills Road & Mosley St. - TEL. 61 2 9841 5471

---

**අටුවා රසකතා**

# විහිළුව

තිස් නමක් පමණ භික්ෂූන් වහනසේ කැළණි මහ සෑය වැඳ අතුරු මගකින් මහ මගට පිවිසෙමින් සිටියහ. ඒ අවස්ථාවේ ගිනි තැබූ හේනක දවස තිස්සේ වැඩ කොට වෙහෙස වී දා ගිය දරමිටියක් හිස තබාගෙන දැලි වැකුණු වැරහැලි රෙදි කඩක් ඉන ඔතාගෙන වැහැරුණු සිරුරක් ඇති වයසක මිනිසෙක් ද ඒ මගට පිවිසියේ ය.

මේ අසරණ මිනිසා දුටු සාමණේර හිමි වරු එකිනෙකා අමතා අර ඔබගේ පියා ය, සුලු පියා ය, මහප්පා ය, සීයා ය ඈ විසින් විහිළු කරන්නට වූහ. අවසන ඔබගේ නම කුමක්දැයි කියාත් ඇසූහ. මේ කථා ඇසීමෙන් දොම්නස් වූ මහලු මිනිසා දරමිටිය බිම දැම්මේ ය. එහි සිටි වැඩි මහලු හිමි නමට ටිකක් නතර වනු මැනවැයි කීයේ ය. රෙදි කඩමල්ල හොඳට ඇඳගෙන තෙරණුවන්ට පසඟ පිහිටුවා වැන්දේ ය. සාමණේර වරු ඒ අවස්ථාවේ ද වට වී විහිළු කළහ.

වයස්ගත මහල්ලා මෙසේ ද කියේ ය.

මට විහිළු කරන ඔබ වහන්සේලා මෙපමණකින් සිවුර පෙරවූ තරමින් මහණ කම සම්පූර්ණ යයි නොසිතනු මැනවි. ඔබ වහන්සේලා කළ යුතු කටයතු මෙතෙක් අසම්පූර්ණය.

හිම්වරුනි, මම මුල දී ඔබ වහන්සේලා වැනි ශ්‍රමනයෙක් වීමි. ඔබ වහන්සේලාට සිත එකඟ කිරීම් මාත්‍රයකුදු නැත. එකල මම මහර්ධි ඇත්තෙක් වීමි. අහස පොළොව කෙළෙමි. පොළොව අහස කෙළෙමි. දුර තැන් ළං කළෙමි. ළඟ දුර කෙළෙමි. ක්‍ෂණයකින් සක්වල දහසක් විනිවිද ගියෙමි.

දැන් වඳුරකුගේ වැනි මේ අත්වලින් එදා සඳ හිරු පිරි මැදීමි. සඳ හිරු පා පුටුව කොට හුන්නෙමි. එවැනි වූ මගේ සෘද්ධිය ප්‍රමාදය නිසා විනාශ විය. අන්‍යයෝද මා මෙන් පමාවෙන් ව්‍යසනයට පත්වෙති. හිම්වරුනි මා අරමුණු කොට අප්‍රමාද වෙත්වායි අවවාද කෙළේය. ඒ කථාව ඇසීමෙන් සංවේගයට පත් තිස් නමක් භික්ෂූහු විදසුන් වඩා රහත් වූහ.

(විභංග අටුවාව)

අත්තුඩාවේ සිරිරාහුල
රෝහණ පාර්ශවයේ මහානායක ස්ථවිර